අල්ලාහුම්ම කිනී අදාබක යව්ම තජ්මඋ අව් තබ්අස් ඉබාදක" (අහෝ දෙවිඳුනි ! ඔබේ ගැත්තන් එකට රැස් කරන හෝ ඔබ යළි අවදි කරන දිනයේ ඔබේ දඬුවමින් මා ආරක්ෂා කරනු මැනව!)

හුදයිෆා ඉබ්නු අල් යමාන් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ ප්‍රකාශ කරන ලදී: සැබැවින්ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් හට නිදා ගැනීමට අවශ්‍ය වූ විට, එතුමාණන් තම දකුණු අත කම්මුල යට තබාගෙන මෙසේ කියනු ඇත: اللّٰهُمَّ قِنِي عَذَابَكَ يَوْمَ تَجْمَعُ أَوْ تَبْعَثُ عِبَادَكَ "අල්ලාහුම්ම කිනී අදාබක යව්ම තජ්මඋ අව් තබ්අස් ඉබාදක" (අහෝ දෙවිඳුනි! ඔබේ ගැත්තන් එකට රැස් කරන හෝ ඔබ යළි අවදි කරන දිනයේ ඔබේ දඬුවමින් මා ආරක්ෂා කරනු මැනව!)

[صحيح] [رواه الترمذي]

සැබැවින්ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් නිදා ගන්නට තම නිදියහනට ගිය විට, එතුමාණන් තම දකුණු අත කොට්ටයක් සේ සකසා තම දකුණු කම්මුල ඒ මත තබාගෙන මෙසේ පවසා සිටියහ: "අල්ලාහුම්ම" මාගේ පරමාධිපතියාණනි, "**කිනී**" මාව ආරක්ෂා කරනු මැනව "අදාබක" ඔබේ දඬුවමින් "යව්ම තජ්මඋ අව් තබ්අස් ඉබාදක" මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන විනිශ්චය දිනයෙහි.

http://sunnah.global/hadeeth/si/show/6167